**ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශය, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මුල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්මක් නිවැරදිව පිළියෙල කර නොතිබීම.<br>2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම.<br>3. තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීමේ සූදානම.<br>4. අධි ප්‍රතිපාදන<br>5. කාර්ය මණ්ඩල පුහුණුවීමේ සැලසුම් නොකිරීම. | 2.1.1<br>2.2.1<br>2.1.2(ඇ)<br>2.7<br>2.11(අ) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම | 2.9<br>2.10 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සතෙයක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කිරීමේ අඩුපාඩු<br>2. වත්කම් ලේඛනගත කිරීමේ අඩුපාඩු | 2.3(ආ)<br>2.3(අ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම. | 2.1.3 |
| 128(1)(උ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම. | 2.8 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | 1. අවිධිමත් ගනුදෙනු<br>2. ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුනොකිරීම.<br>3. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්<br>4. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.5<br>2.2.1<br>2.1.2(ආ)<br>2.2.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඒ) | දරන ලද කිසියම් වියදමක් හෝ වගකීමක් බැඳීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයක ඇතුළත වැටෙන බව හා එය ප්‍රමාණවත් තරම් අධිකාර බලයෙන් ආවරණය වන බව. | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට බැඳීම. | 2.4 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩ සටහන් වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව. | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9(අ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-------------------------------------------------

### 2.1 කාර්යසාධනය

---------------

#### 2.1.1 සැලැසුම් කිරීම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 05 ක් පැවතුණි. දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා සුහසාධන හා සංවර්ධන අරමුදලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව සත්ව අභිජනනය හා සත්ව සංරක්ෂණය, සත්ව සුහසාධනය, ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය යන කාර්යයන් සඳහා රු.මිලියන 508.7 ක ප්‍රතිපාදනය වෙන්කර තිබුණද අධ්‍යාපනය හා පර්යේෂණය යන ප්‍රධාන කාර්යයන් එහි ඇතුළත් කර නොතිබුණි.

#### 2.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------------------------------------

රිදියගම සෆාරි උද්‍යානයේ ආසියානු කලාපීය සහ බෙංගල් කොටි කලාපය සඳහා විදුලි වැටවල් ඉදිකිරීමට පිළිවෙලින් රු.මිලියන 7 ක සහ රු.මිලියන 0.80 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දෙහිවල සත්ව රෝහල ඉදිකිරීම සහ පින්නවල අලි අනාථාගාරයේ පොකුණු නවීකරණය කිරීම යන ව්‍යාපෘති 02 සඳහා පිළිවෙලින් රු.මිලියන 72.97 ක් සහ රු.මිලියන 34.81 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම කාර්යයන් පිළිවෙලින් 2018 ජුනි 26 හා 2017 දෙසැම්බර් 09 දිනවලද නිමකළ යුතු වුවද 2018 ජුලි 15 දින වනවිටත් නිමකර නොතිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමේ සූදානම**

දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු 05 ක් හා ඉලක්කයන් 09 ක් හඳුනාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන තිබුණ ද මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම අරමුණු හා ඉලක්කයන් පිළිබඳව කිසිදු දැනුවත්කිරීමේ වැඩසටහනක් දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කිරීමේදී මෙම අරමුණු කරා ළඟා වීමට හැකි අයුරින් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුලි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබාගැනීම

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ඉටුකර ගැනීම සඳහා රු.මිලියන 77.94 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 59.26 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

**-------------------------------------------------------**

ප්‍රසම්පාදන සැලසුම් කිරීමේදී, ප්‍රසම්පාදන පැකේජ සාරාංශය, හඳුනාගත් ප්‍රසම්පාදනයට අදාලව පවතින විශේෂ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි පිළියෙල කර නොතිබුණු අතර ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්ම ද පිළියෙල කර නොතිබුණි.

**(ආ) පූර්ව කොන්ත්‍රාත් අදියරය**

**---------------------------**

මෙම අදියර යටතේ දී උපදේශන සේවා සඳහා සහ වැඩ, භාණ්ඩ සහ සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙළ කර නොතිබුණු අතර එකිනෙක කොන්ත්‍රාත් පැකේජ සහ ප්‍රසම්පාදන කාල උපලේඛනය යන ලියකියවිලි ද පිළියෙල කර නොතිබුණි.

**(ඇ) පශ්චාත් කොන්ත්‍රාත් (කොන්ත්‍රාත් පරිපාලනය) අදියරය**

**----------------------------------------------------------**

කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම සහ ඒ සමඟ බද්ධ වූ මුදල් ගලායැම් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙහිවල සත්වෝද්‍යානයේ මාර්ග අංක 8 ඉදිකිරීම්

-------------------------------------------------------

(i) ප්‍රසම්පාදන අරමුණු ලෙස අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, ඵලදායකත්වය ළඟාකර ගැනීම සඳහා වඩාත් තාත්වික පිරිවැය ඇස්තමේන්තු හා ප්‍රමාණපත් (BOQ) සැකසීම වැදගත්වන නමුත් මෙම ඇස්තමේන්තු සකස් කිරීමේදී එහි ඇස්තමේන්තුගත රු.45,354,486 ක මුදල තුළ වූ ප්‍රධාන කාර්යයන්ගෙන් රු.13,792,486 ක Meer Kat Ferret & Enclosure, Bird Enclosure, Summer Hut යන කාර්යයන් ඉටුකිරීමකින් තොරව ව්‍යාපෘතිය අවසන් කොට තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව භෞතික හදිසි අවශ්‍යතා සඳහා සියයට 10 ක් දක්වා උපරිමයකට යටත්ව මුදල් වෙන් කළ හැකි වුවද එම මුදල අනුමත ප්‍රමාණ පතෙහි (BOQ) සඳහන් කාර්යයන්වල සිදුවන වෙනස්කම් හා විචලනවලට අදාළ පිරිවැය හා අනුබද්ධ විය යුතුය. එසේ වුවද ව්‍යාපෘතියෙන් පරිබාහිරව එකතුව රු.1,198,829 ක වැඩ අවිනිශ්චිතතා හා අමතර වැඩ යටතේ පිරිවැය ගත කොට ඉදිකිරීම් සිදුකර තිබුණි.

(iii) මාර්ග අංක 8 ව්‍යාපෘතියේ අමතර වැඩ ලෙස රු.182,088 ක වියදමකින් ජල උද්‍යානය අසල නැරඹුම් මැදිරියක් ඉදිකර තිබුණද, ජල උද්‍යානය මනාව දර්ශනය වන ආකාරයට නැරඹුම් මැදිරිය ඉදිකර නොතිබුණි. තවද එම ජල උද්‍යානය වෙත අපවිත්‍ර ජලය බැහැර කිරීම හේතුවෙන් ජලය දූෂණය වී ඇති ආකාරය භෞතික පරීක්ෂාවේදී විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ අනුව නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් ඵලදායි නොවන බව නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සඳහා වර්ග අඩි 10,000 ක් පමණ වූ ක්ෂේත්‍ර ඵලයකින් යුත් ගොඩනැගිල්ලක් කුලියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීම්

---

ප්‍රවේශ මාර්ගය හා වාහන 10 ක් නවතා තැබීමට ඇති හැකියාව ප්‍රධාන ඇගයීම් නිර්නායක වී තිබුණු අතර එය සපුරා නොතිබූ ලංසුකරුට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ඉ) මාර්ගෝපදේශයට පටහැනිව ලංසුව පිරිනමා තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරීම

---

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාහන, පිරියත හා යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, ගොඩනැගිලි, ඉඩම් සහ කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ යන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 ජුනි 30 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පින්නවල අලි අනාථාගාරයේ ආරක්ෂක අංශය සහ වාගොල්ල නව සත්වෝද්‍යාන පුස්තකාලය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ii) 2017 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු නිර්දේශ අනුව පින්නවල අලි අනාථාගාරයේ ගබඩාව තුළ හා දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ පුස්තකාලය තුළ වර්ෂ ගණනාවක සිට පැවැති පැරණි අබලි ද්‍රව්‍ය අපහරණය නොකර ගබඩා කර තිබුණි.

## 2.4 බැඳීම් හා බැරකම්

---

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වලට එළඹීම**

---

2017 අප්‍රේල් 27 දිනැති අංක 288/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූලව වැය විෂය 06 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 13.14 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 0.19 ක ඉතිරිවීම් ඉක්මවා රු.මිලියන 8.82 ක බැඳීම්වලට එළඹ තිබුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) තැන්පත් ගිණුමෙන් ගෙවීම් සඳහා නිලධාරීන් දෙදෙනෙකු වියදම් සහතික කළ යුතු වුවත් රු.2,924,314 ක වටිනාකමකින් යුත් වවුචර 6 ක් සඳහා එක් නිලධාරියෙකු පමණක් වියදම් සහතික කර ගෙවීම් කර තිබුණි.

(ආ) එකතුව රු.1,158,062 ක් වටිනා වවුචර් පත් 02 ක් සඳහා අනුමත කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව ඡේද අංකය | යොමුගත විෂයය |
|---|---|
| 3.10 (i) | පින්නවල හා වාගොල්ල ඉඩම් පවරා නොගැනීම. |
| 3.10 (ii) | ඉඩම් අක්කර 79 රූඩ් 01 පර්චස් 27 ක් වූ ඉඩම් කැබලි 8 ක් පවරා නොගැනීම. |

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 172.20 | 172.08 | 0.12 | 0.07 |
| | මූලධන | 647.03 | 351.42 | 295.60 | 45.69 |
| | **එකතුව** | **819.23** | **523.50** | **295.72** | **36.10** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 221.75 | 219.10 | 2.65 | 1.19 |
| | මූලධන | 516.98 | 163.31 | 353.67 | 68.41 |
| | **එකතුව** | **738.73** | **383.31** | **355.42** | **48.11** |
| 2015 | පුනරාවර්තන | 299.78 | 299.08 | 0.70 | 0.23 |
| | මූලධන | 596.65 | 564.15 | 32.50 | 5.45 |
| | **එකතුව** | **896.43** | **863.23** | **33.20** | **3.70** |
| 2016 | පුනරාවර්තන | 345.21 | 344.21 | 1.00 | 0.29 |
| | මූලධන | 539.70 | 453.40 | 86.30 | 15.99 |
| | **එකතුව** | **884.91** | **797.61** | **87.30** | **9.86** |
| 2017 | පුනරාවර්තන | 379.16 | 375.90 | 3.26 | 0.86 |
| | මූලධන | 508.70 | 451.87 | 56.83 | 11.17 |
| | **එකතුව** | **887.86** | **827.77** | **60.09** | **6.76** |

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**
**---------------------------**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 54 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**
**-----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**
**----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| -------- | | --------- | | ------------- | |
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| --------- | ------ | ------------ | ------- | --------- | ------- |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 30 | 29.86 | 14 | 15,37 | 90 | 61,83 |

**(ආ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

-----------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.2,426,092 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එසේ වුවත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිම පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| | ---------------- | ---------------- | -------------- |
| (අ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය. | පවත්වා නොතිබුණි. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එන් 20 ආකෘතිය | පවත්වා නොතිබුණි. |
| (ඉ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඈ) | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (උ) | වට්ටෝරු භාණ්ඩ ලේඛනය සහ තොග පොත් | මුදල් රෙගුලාසි 751 හා මුදල් රෙගුලාසි 763 | පවත්වා නොතිබුණි. |
| (ඌ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | යාවත්කාලීන කර නොතිබුණි. |
| (එ) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඒ) | වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය | යාවත්කාලීන කර නොතිබුණි |

## 2.10 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2015 දෙසැම්බර් 11 දිනැති පීඑන්ඩී/04/08/01/59 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පොදු ලිපිය අනුව සියලු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවද ජාතික සත්වෝද්‍යානවලින් 2017 වර්ෂයේ ලද රු.මිලියන 976.20 ක් සුභසාධන හා සංවර්ධන අරමුදලට බැරකර තිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 217.02 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒකපුද්ගල වියදම රු.මිලියන 0.31 ක් විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 24 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 230 | 166 | 64 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 621 | 504 | 117 |
| | එකතුව | 882 | 695 | 187 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

**---------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයට 2016 වර්ෂයේ සිට රියදුරෙකු මුදාහැර තිබුණි.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**--------------------------------**

සමාලෝචිත වර්ෂය තුළදී පුහුණු කටයුතු සැලසුම් නොකිරීම හේතුවෙන්, ප්‍රාථමික, ද්විතියික හා මාණ්ඩලික ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 641 දෙනෙකු සඳහා කිසිදු පුහුණුවක් ලබා දී නොතිබුණි.